**ශීර්ෂය - 18 පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 15 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 27 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික වියයුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුලත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුලත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම**

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් 2021 නොවැම්බර් 26 දින නිකුත් කල රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්,එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථාවක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මාර්ගෝපදේශයෙහි 7.9 ඡේදයට අනුව, මූල්‍ය කාල සීමාව අවසානයේ ආයතනය විසින් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන ලද මුදල් ශේෂය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ඇතුළත් නොකළ යුතු වුවත්, ආයතනය විසින් වර්ෂය අවසානයේ භාණ්ඩාගාරයට පියවන ලද රු.7,183 ක මුදල මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ඇතුළත් කර තිබුණි. | මූල්‍ය කාල සීමාව අවසානයේ දී භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන ලද මුදල් ශේෂය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ඇතුළත් නොකිරීමට ඉදිරියේ දී කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදි. | චක්‍රලේඛ මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

### (අ) ආදායම් නොවන ලැබීම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුල භාණ්ඩාගාරයෙන් ලද රු.123,139,364 ක අග්‍රිම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ රු.123,093,000 ක් ලෙස රු.46,364 ක් අඩුවෙන් දක්වා තිබුණි. | භාණ්ඩාගාර මුද්‍රිත (SA-70) අනුවද සමාලෝචිත වසර තුල ලැබී තිබූ අග්‍රිම ප්‍රමාණය රු.123,093,000 ක් වේ. ඉතිරි රු.46,364 අබලි භාණ්ඩ වෙන්දේසිය,පැරණි පුවත්පත් විකිණීම ආදී වෙනත් ලැබීම් වන අතර මෙම දෙපාර්තුමේන්තුව B ශ්‍රේණිය යටතට ගැනෙන බැවින් එම ලැබීම්ද රජයේ ආදායම් සංකේත අනුව යොමු කර ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතුය. |

### (ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | අත්තිකාරම් ගිණුමට (ඒසීඒ - 5) අනුව වර්ෂය තුල අත්තිකාරම් ගෙවීම් රු.2,769,649 ක් වූවත්, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ රු.2,617,330 ක් ලෙස සටහන් කිරීම හේතුවෙන් රු.152,319 ක වෙනසක් විය. | ඉහත (ආ) යටතේ සඳහන් කර ඇති රු.135,100 ක සටහන නිවැරදි කිරීම සහ වැරදි ලෙස 2019 වසර තුල දී ඇතුලත් කර තිබූ රු.17,219 ක ණය පොලී මුදලක් නිවැරදි කිරීම හේතුවෙන් මෙම වෙනස නිරීක්ෂණය වේ. | මාර්ගෝපදේශයන්ට අනුකූලව සංඛ්‍යාවන් සැසඳී තිබිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | අත්තිකාරම් ගිණුමට ( ඒසීඒ -5 ) අනුව වර්ෂය තුල අත්තිකාරම් ලැබීම් රු.3,135,510 ක් වුවත්**,** මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ රු.2,852,910 ක් ලෙස දක්වා තිබීමෙන් රු.282,600 ක වෙනසක් විය. | ACA-5 භාණ්ඩාගාර මුද්‍රිත (සාරාංශ) අනුව ගලපා සකස් කර ඇත. භාණ්ඩාගාරය විසින් 2020 දෙසැම්බර් මාසය සඳහා ඇතුලත් නොකරන ලද රු.147,500 ක මුදල සහ 2021 වසරේදී ඇතුලත් කරන ලද රු.135,000 ක මුදල හේතුවෙන් මෙම රු.282,600 ක වෙනස නිරීක්ෂණය විය. | මාර්ගෝපදේශයන්ට අනුකූලව සංඛ්‍යාවන් සැසඳී තිබිය යුතුය. |

## 02. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 වියදම් කළමනාකරණය

-------------------------

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ---------------------- | ------------------------- | ----------------- |
| ප්‍රධාන ගණන්දිමේ නිලධාරින් විසින් මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කළ යුතු අතර මුදල් රෙගුලාසි 127(5) ප්‍රකාරව, ඇස්තමේන්තු ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති වෙනස්වීම් සම්බන්ධයෙන් දැඩි අවධානය යොමු කළ යුතු වුවත් , පුනරාවර්තන වැය විෂයයන් 09 ක් සඳහා සියයට 40 සිට සියයට 100 දක්වා ඉතිරිවීම් වූ අතර වැය විෂයය 01- 1202 හි මූලික වියදම් ඇස්තමේන්තුව වර්ෂය අවසානයේදි සියයට 123 කින් වැඩි කරගෙන තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | වියදම් නිවැරදිව තක්සේරු කර වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |

**03. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලැසුම් කිරීම**

**3.1.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| වාර්ෂික ඇස්තමේන්තුවට අනුව වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම පිලියෙල කළ යුතු නමුත්, 2021 වර්ෂයේ මූලධන -2102 හා පුනරාවර්තන -1201 වැය විෂයයන්හි වාර්ෂික ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු.1,100,000 කින් ඉක්මවා ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර තිබුණි. | තනතුර වෙනුවෙන් නව කාර්යාල උපකරණ මිලදී ගැනීම අත්‍යවශ්‍යව තිබීම හා ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන් 159 දෙනෙකුගේ රාජකාරී කටයුතුවලට සහාය දැක්වීමට කටයුතු කිරීමේදි, අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි පාර්ලිමේන්තුවේ නව ව්‍යවස්ථා පැනවීමේදීත්, ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන්ගේ අදහස් හා යෝජනා ලබා ගැනීමේ කාර්යභාරය මෙම කාර්යාලයට අලුතින් පනවා ඇති හෙයින් ද, මෙම ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා සඳහා මිලියන 02 ක පමණ මුදලක් වැයවන බව අපේක්ෂා කළ හෙයින් එම මුදල ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කරන ලදි. | වාර්ෂික ඇස්තමේන්තුවට අනුව වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතුය. |

## 3.2 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කාර්යාලයේ වාර්ෂික නේවාසික පුහුණු වැඩසටහනකට සුදුසු ස්ථානයක් සොයා බැලීමට අවස්ථා 02 ක දී කිලෝමීටර් 812 ක දුර ප්‍රමාණයක් කොළඹින් බැහැරව ධාවනය කර තිබූ අතර ඉන්ධන සඳහා රු.15,890 ක් වැය කර තිබුණද, වර්ෂය තුල නේවාසික පුහුණු වැඩසටහනක් එම ප්‍රදේශවල පවත්වා නොතිබුණි. | පුහුණු වැඩමුව පැවැත්වීමට පූර්ව ස්ථාන පරීක්ෂණයට යාමේ දී ඉන්ධන සඳහා රු.15,890 ක මුදල වැය වූ නමුත් රටේ පැවති තත්ත්වය අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ මගින්, පුහුණු වැඩමුළු අත්හිටුවීමට හා පළාත් සංචරණ සීමා පැනවීමට කටයුතු කිරීම හේතුවෙන් අදාල පුහුණු වැඩමුළු පැවැත්වීමට නොහැකි විය. | ඵලදායීතාවය සම්බන්ධයෙන් සලකා බැලීමෙන් පසු තීරණ ගැනීම සඳහා අවධානය යොමු කළ යුතුය. |

## 04. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 හි 6.3 ඡේදය ප්‍රකාරව එක් එක් නිලධාරී තලය අනුව හඳුනාගත් නිපුනතා ඉලක්ක සපුරා ගැනීම පිණිස සුදුසු ධාරිතා සංවර්ධන වැඩ සටහන් සකස් කර නොතිබුණි. | පසුගිය වසරේ මුල් කාර්තු 03 තුල කොරෝනා වසංගත තත්ත්වය මත ධාරිතා වැඩසටහන් සංවිධානය කිරීමට නොහැකි විය. කෙසේ වෙතත් අවසන් කාර්තුවේ සියලුම නිලධාරීන් ආවරණය වන පරිදි නිපුනතා ඉලක්ක සපුරා ගැනීම සඳහා ධාරිතා වැඩ සටහන් 04 ක් සිදු කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | උක්ත චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්යය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යයසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | 2022 වසරේ සිට සමස්ත කාර්යය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යය සාධන ගිවිසුම් අත්සන් කිරීමට නිලධාරීන්ට උපදෙස් දී ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |